# නිර්මාණ Nirmana



## ප්‍රේමය අන්ධ නැත !

දෙදෙනා දෑත අල්ලා සැරයටිය ගෙන
හෙමිහිට ගමන්කර කවදත් සිටින තැන
නැවතී පතුරුවන රස ගී මිහිර දෙන
යුවලක් ඇත වෙළෙඳ සල පඩි නගින තැන

මේ දෙදෙනාට නැත ඇස්දෙක පෙනෙන් නේ
කාගෙන්වත් තමයි කැමක් ලැබෙන් නේ
දෙන්නට දෙන්නා අහුලාගෙන කවන් නේ
කුරුළු ජෝඩුවක් වාගෙයි සිටින් නේ

අත පත ගා දෙදෙන දෙදෙනගෙ මුහුණ පිස
ආදර බස් දොඩයි නිතරම මිහිරි රස
සමගිය සමාදානය ආදරය මිස
නැහැ කිසි විටෙක සැක සංකා පිරුණු හිස

ඇඟ රැළි වැටී හිසකෙස් සුදු වෙලා ඇත
දත් ගිලිහිලා හකුපාඩා ගිලී ඇත
තිබු ගත සවිය ටික ටික පිරිහිලා ඇත
එනමුත් දෙහද ආදරයෙන් පිරී ඇත

අද යුග දිවි මිහිර වියැලී පවුල් වල
ඇත මත ගැටුම් නැත සහනය නිවෙස් වල
අද මිනිසුන් නොදැක ඉරියව් මුහුණු වල
මොන සැපතක් විඳිනවද හද කුටිය තුළ

වග වළසුන් නයින් පොළඟුන් වැනි කුරිරු
මිනිසුන් රඟයි ඇනගන්නා ලෙස බඹරු
නෙත් ඇති ජෝඩු දිවිගෙවනා විට නපුරු
අඳබව හොඳ වගෙයි දෙන පෙම් රස මියුරු

♦ **ප්‍රේමා එස්. රූපසිංහ**
නුගේගොඩ Sri Lanka

## සතුට හොරු අරන් !

නෑයන් අසල්වැසියන් වින කරන විට
නුඹ දෙදෙනා එකමුතු වී සිටින විට
තිබුණු බලය ගැන අද සිහිකරන විට
සතුටු කඳුළු පිරුණා මගෙ නෙත් යුගට

මහගෙයි අයිතියට යුද වැද සිටින පුතේ
ඔබ දෙදෙනාම මට ඉර හඳ වගෙයි පුතේ
පැත්තක් ගන්න මට කොහොමත් හිතක් නැතේ
සැනසුම සතුට හොරු අරගෙන ගියා පුතේ

වෙන්නට යන්නෙ මහ විපතක් බව දැනිලා
නංගිල මල්ලිලා ඉන්නව හීත වෙලා
ජීවත්වීම මට දැන් හරි දුකක් වෙලා
දැස පියාගම් නුඹලට සෙත් පතලා

♦ **කුමාරි විජේරත්න**
Hounslow Middx UK

## අම්මා

දස මාසයක් අප කුස තුළ සඟව ගෙන
බිහිකර ලොවට ලේ කිරි කර පෙව් පෙමින
ඒ හැම මවුන් ගුණ බිඳුවක් පව සන්න
මේ පැදි ලියමි ඔබ මොහොතක් කන් දෙන්න

කන බොන අඳින පළඳින හැටි පෙන්වන් නේ
හොඳ වචනයෙන් අමතන්නට පවසන් නේ
යහ මග යන්ට ශිල්පය මුලදී දෙන් නේ
එහෙමයි මව්පියන් දරුනට සලකන් නේ

රජයේ ඉහළ තනතුරු අරගෙන දෙන්න
පෙම්මාදරින් සිත සහනය සල සන්න
දරුවන් දියුණුවනු දැක සහතුට වන්න
අම්මා තාත්තා දෙවිවරු ලොව ඉන්න

අම්මා නැවක් නම් සමුදුර පාව යන
වෙති පියතුමෝ කප්පිත්තෙක් එහි සිටින
ගෙදර බුදුන් යයි අම්මා හැඳින් වෙන
ඔවුනට සැලකීම කුසලකි නොවර දින

අම්මා නැති ගෙදර අමු සොහොනක් වැන්න
තාත්තා නැතොත් හිරු සැඟවුණ වැන්න
ඒ දෙදෙනා ඔබේ පණ මෙන් රැක ගන්න
හිරු සඳු ලෙසට දෙගුරුන්හට සලකන්න

♦ **එස්. කංකානම්ගේ**
London SE 5



## නව වසරට සුබපැතුම් !

තුනුවග රනින් සරසා ගෙන පුරා වසක්
සුරගඟ මතින් යයි හිරු දෙව් සවාරි යක්
කොමළඟ තොසින් ගෙන එම කල් විරාම යක්
පෙර මග බසින් නව අවුරුදු කුමාරි යක්!

මනනඳ සුනෙර ලෙළවන පුවතර ඉන්දු
පැහැනද රිවිඳු සිසිනිඳු ලෙද නම රැන්දු
සුරරද සදිසි නෙක වියතුන් මන බැන්දු
සකිසඳ නුඹය වැලිකතරට දිය කැන්දු

ලෙළදෙන ගුවන පදරුත් කිරුණැළු පැතිරු
අළලන මනස අමයුරු සුපුවත් ඇතිරු
සිළුමිණ සදිසි බස සුලකළ කළ මිතුරු
ලොබවන සියළු දන කියවති එහි අකුරු

තරසර මතවාද කරළිය සසොබ වන
පබසර කවි පියලි අමුණන මෙවුල් මිණ
මැතිවර වරද නිවරද තෙපලන සොඳින
පැණසර සබා ගැබ ඉසුරිඳු නයන මෙන

සඳවන් දහම් හෙළබස රැස වොරැදේවා
සඳවන් සිරින් සිරි ලක්බිම බැබලේවා
සඳවන් මෙතින් එහි පිරිවර සැනසේවා
සඳවන් යස රැසින් මිතුදම සැරදේවා!

♦ **ශ්‍රියා කුමාරසිංහ**
Dunedin - New Zealand

## නමස්කාර වේවා!

අඳුර බිඳී උදාවූ ආලෝකයෙන්
උදම්වන්නට ප්‍රීතිවන්නට
නිදහසේ ඔබ මොබ සරන්නට
සිතට සහනය සහ දිරිය
හැකියාව ලබා දුන්
රණවිරු පුත්‍රයිනි දුහිතෘනි
නුඹලාට නමස්කාරවේවා!
මේ උදාවූ නව වසරේ!

පැතුයෙමු අපි තිස්වසරක් පුරා
සොරාගෙන තිබූ නිදහස අපෙන්
නිවී සැනසිල්ලේ මග තොටක
රැයේ දහවල නිවහනක
වෙසෙන්නට බියෙන් තොරව
ඒ හැකියාව ඉටුකර දුන්
නුඹලාට නමස්කාර වේවා!

♦ **විද්‍යා සුබසිංහ**
Sri Lanka


## නොනිමෙන පහන

උම්බෑ පමණයි කියවන්නේ
වස්සා එය හරිහැටි දන්නේ
දන්නා ටික හොඳින්
දැනගනු නොලසින්
සුරු විරුවෙක් ඔවදන් දුන්නේ

සැයෙ කොතක් මෙන් බැබළේ
වැවුරුකන්නලත් සිහලේ
බසට සක්විති
කුමරතුඟු නිති
මුල්ගුරු දෙව් හෙළ හවුලේ

ලක් මාතාවට සෙත සැදූ
ශික්ෂාමාර්ග පරසිඳු
සිරිලක් ගොමුවේ
නොමියන පැලවේ
පවතී විලසින් හිරු සඳු

**රවිකා චන්ද්‍රා රාජපක්ෂ**
යක්කල Sri Lanka



## පිය සමර

ඉම කොන නොදත් දැහැනෙක එරමිණිය ගෙතී
තවුසෙකු පරිදි සුරකින ඉඳු නිසල ගතී
කළ හැටි දෙනෙත තුන්නෙත මට මතක ඇතී
ඔබගේ ඇසින් ඇස කළ ඉඟි අසිරි මතී

බටුවන්තුඩාවෙන් කොළඹට පැමිණ එදා
සිංහල කවියනට කවියට අසුන පුදා
ආගිය ගමන් සිහිනෙකි දුක් කඳුළු බෙදා
හැගොඩ කියන නම මට මතකයකි සදා

සිටියදි පොලිස් නිවහන තුළ මරදානේ
උතුරෙන් බටහිරෙන් දකුණෙන් දින ගාණේ
කවියන් පැමිණ පොබ කළ සිතුවිලි සීනේ
රැඳුණේ තෙවැනි නෙතු කැන් හමුවන මානේ

නන්නියෙ අයියනායක අඩවියෙහි සිට
කුමරෙකු මී සුවඳ සුළඟින් එවන විට
හපු බංඩාර දෙවි ඇතුගල් සෙවන යට
පුදපෙත් ලැබූ වග දතුයේ ඔබෙනි රට

අලි ගිය පාලමේ සාගර තරඟ වැදී
මිණිපුර බඹරකොටුවක ගුමු ගුමුව රැඳී
චතුරේගමක බිංගිරියක පැහැය රැඳී
තුන්වන ඇසින් ඔබ සටහන් කරන ලදී

මුළු මීතොටක දියවන්නා නදිය ළඟ
කළු ගං තොටේ දැක දියරැළ රඟන රඟ
ඔබ එක ඇසක් පියවා සමවතෙක නැඟ
පළ කළ හැඟුම් අද කවියක් වැනිය දිග

අනුරාපුරය පුලතිසිපුර දඹ දෙනිය
නටබුන් නගර මැද නෙතු රැස් විහි දුනිය
හිස සුන් පිළිමයක ගල් කණුවක තනිය
ඔබ දුටු අයුරු සෙල් ලිපි ලියැවුණු වැනිය

කඩුපුල් මලක් රෑ දොළහට තවම පිපේ
අර කළුකෙල්ල නිහඬව උරහිසෙහි හැපේ
සේයා සිහින පට දුක් කඳුලකට කැපේ
ඔබ ඇස නොදැක පියවෙයි හැම ඇසම අපේ

♦ **ආර්. පාලිත හැගොඩ**
Sri Lanka

## A fox - hunt



When lead hounds pick up a spoor of a red fox,
A hunting horn is blown;
With fretful snarls, yelps, high-pitched whines
The chase begins, the pack unleashed, their
blood-lust mounts.
Stirr-up cups are drunk!
In elegant crimson riding habits horse men and women canter
Across the valleys at times in lines of eight abreast.
---- -------- --------- ---------- --------
Two red streaks at full stretch weave, dodge, twist and turn,
Use every trick…..but panic turns to terror
The pace slows: too late-
Their bodies lie mangled.

♦ **Denis Jansz - London NW 8**



## හිම අසිරි !

වැටෙන වැටෙන හිම දිසේ දැසමන් පෙතී
විසිර විසිර යයි වහා සුළඟ හා එතී
දකින දකින දෙස පිරී සුසුදු හිම ඇතී
අවරගිරේ අසිරියයි අපට දැක නැතී

කුසුම් පැළඳ සටි එදා තුරුමුදුන් විසල්
හැලී සියළු කොළ මෙදා වෙලා දර ඉපල්
නමුදු සුසුදු හිම නහා විහදවා ලකල්
දකින දකින නෙත වහා බැඳ තබයි සියල්

පැළඳ දිගැති ගන කබා මැසුණු නෙක් සමින්
යනෙන සඳේ හිම මතේ ලිස්ස ලිස්ස මින්
ගැහෙන සැලෙන සීතලේ හදට දුක් දෙමින්
නිබඳ දැනෙන්නේ නොමින් තනිවු බැව් තමන්

නොමැති නමුදු හිම මෙසේ බඳුන්වල මිසක්
සොඳුරු මහරු උණුසුමෙන් ගුණෙන් පිරි දෙසක්
තිබෙන බැව්ද පෙරදිගෙහි මමත් එහි කෙනෙක්
බවද අසන කාහටත් කියම් මම් උදක්!

**මේ** දිනවල මුළු මහත් එංගලන්තය පමණක් නොව යුරෝපීය රටවල් ගණනාවක්ම අධික හිම පතනය නිසා විශාල දුෂ්කරතාවන්ට මුහුණ පා සිටී. සමහර තැන්වල අඩි ගණනක් උසට හිම පිරී පවතී. ගමනා ගමන දුෂ්කරය. සියළු කායීයන් ඇනහිට ඇත. එළියට බහින්නට බැරි සීතලය.

දැනට වසර **31** කට පෙර ලන්ඩනයට මා ආවේ මෙවැනි සීත කාලයකය. එදා ද මේ වගේම අධික ලෙස හිම වැටී තිබුණේය. මට එදා ලන්ඩනය පෙනුණේ එකම සුදු පුළුන් කැටියක් ලෙසටය. ප්‍රථම වරට හිම දැක ඇතිවූ පුදුමයෙන් හා සොම්නසින් යුතුව මම **1979** පෙබරවාරියේ සිළුමිණ පත්‍රයට හිම ගැන කවිපෙලක් ලියා යැවීමි. මේ සමග ඇත්තේ එදා මා ලියූ ඒ කවි පන්තියයි.

♦ **දයා ආනන්ද**

## අපි දෙන්නා

බඩ වැටියේ දං පඳුරේ බෝවිටියා ගස් අතරේ
මලිති බටිති සද්ද පස්සෙ උන් පසු පස යන අතරේ
ලොකු දං ගෙඩියක් දුටුවම එය කඩලා හෙමින් සැරේ
අන් ළමුන්ට හොර රහසේ මට කැව්වා ඔබ සොයුරේ

අත් අල්ලා නියර දිගේ දුවල ගිහින් කුඹුරු වෙලේ
වක්කඩ හිර කර බැඳලා වතුර පිරුණු මාලු වලේ
රඟන පුංචි මාලු පැටව් අල්ලන්නට උදව් කළේ
නුඹයි අයියෙ මගෙ තනියට ළඟින් සිටියෙ සැම කලේ

පේර ගසේ සැඟවී තිබුණු ඉදුණු පේර ගෙඩි දකලා
හෙමින් හෙමින් ගෙන දුන්නේ මගෙ අතටයි එය කඩලා
වෙරලු ගහේ ගස් දෙබලේ මා නග්ගා ඉන්දාලා
උඩ අත්තේ ගෙඩි කැඩුවේ මට දෙන්නයි ඉදවාලා

අත අල්ලා පාර දිගේ අකුරට ගිය අප දෙන්නා
ලොකු අය නැති විට මා ළඟ මගෙ තනියට නුඹ උන්නා
එකට කකා එකට බිබී ළමා වියේ අප දෙන්නා
හිටිය විදිහ අදත් මගේ හිත සතුටින් සනසන්නා

කාලය සමගින් අපේ ළමාවිය ගව් ගණනක් ඈතට දුවලා
කැදැල්ල විසිරී අප දැන් ඉන්නේ ඈතට ඈතට වීසි වෙලා
හිත පිරි මදිමින් දුක නැති කරමින් සීතල රටකට ගුලි වීලා
මම තනියම අද නුඹ නෑ මාළඟ ගතසිත හොඳටම බොඳවීලා

අටලෝ දහමේ විදිහ කියා දෙන ගෙවෙනා කාලය සංසාරේ
මනු සිත පහදයි අරුත පසක් වෙයි ජීවිතයේ හැටි ඉන් තේරේ
ඔබ වැඩි හිටියෙකි වැඩිහිටි නිවසේ
මගෙ සිත හද ශෝකෙන් ඉතිරේ
යළි මතු බවයක යළි එක් වෙන්නට
මම නැවතත් පතනෙමි සොයුරේ

♦ **මධුරි අබේවික්‍රම** Harrow UK